ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/09

ජාත්‍යන්තර නීතිය - **LWU 3315/4335**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.10.15 වේලාව - පෙ.ව. 11.30 - ප.ව. 12.10 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) ඒකවාදය හා ද්විවාදය යන ගුරුකුල අතර සමථයක් ඇති කිරීම සඳහා ශ්‍රීමත් ජෙරල්ඩ් ෆිට්ස්මොරිස් විසින් කරන ලද යෝජනා පිළිබඳ අදහස් දක්වන්න.

(ලකුණු 08)

(ආ) වුටූ රාජ්‍යය සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් වන අතර එම රට බරපතල යුද්ධයකට මුහුණ දී සිටී. වර්ෂ 2005 දී ඉහල මානව හිමිකම් ප්‍රමිතීන්ගෙන් සමන්විත වූ සියළු ආකාරයේ මානව හිමිකම් කඩවීමේ පිටුදැකීමේ මාකිපෝලෝ ජාත්‍යන්තර සම්මුතිය වුටූ රාජ්‍ය විසින් අපරානුමත කරන ලදී. යුධ කාලසීමාව තුල වුටූ රාජ්‍ය ආයතන මගින් බරපතල මානව හිමිකම් කඩවීම් වලට ලක් වූ තොම්සන් මහතා 2005 දී වුටූ රාජ්‍යය විසින් අපරානුමත කරන ලද මාකිපෝලෝ ජාත්‍යන්තර සම්මුතිය යටතේ සහන අයැද සිටී.

වුටූ රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ජනරජ ව්‍යවස්ථාව ට සමාන යැයි උපකල්පනය කරමින් තොම්සන් මහතාට උපදෙස් දෙන්න.

(ලකුණු 12)

02. චාරිත්‍රවලට තිබූ තත්වය පහත වැටීම සඳහා සාමාන්‍ය හේතුව වන්නේ ජාත්‍යන්තර ප්‍රජාවේ සාමාජිකත්වය ජාත්‍යන්තර චාරිත්‍ර නීතියේ මුල් කාලයට සාපේක්ෂව විශාල වීමයි. (වසර 100 ක කාල පරාසයක් තුල රාජ්‍යයන්ගේ සංඛ්‍යාව 40 පමණ සංඛ්‍යාවක සිට ආසන්න වශයෙන් 200 ක් දක්වා වැඩිවිය. ) වඩාත් වැදගත් ලෙස ජාත්‍යන්තර ප්‍රජාවේ සාමාජිකයන් බරපතල ලෙස ආර්ථික හා දේශපාලන වශයෙන් බෙදීමකට ලක් ව ඇත. එමගින් විශාල වශයෙන් විවිධ වූ රාජ්‍යයන් වැඩි ප්‍රමාණයක සහයෝගය සාමාන්‍ය රීතීවලට ලබා ගැනීම ඉතා අපහසු වී ඇත්තේ ය. ඒ ආකාරයෙන්ම නව රීතියක් මතු වී ඇත්දැයි තීරණය කිරීම අතිශයින් අසීරු වී ඇත්තේ ඒ සඳහා අවශ්‍ය වන්නා වූ සාක්ෂි ප්‍රමාණය ලබා ගැනීමට සෑමවිටම නොහැකි වන හෙයිනි.

**Cases & Materials on International Law, D.J.Harris, 6th Ed.(2004)**
**පිටු 41-42 හිදී**

ජාත්‍යන්තර චාරිත්‍ර නීතියේ උපචාර හා ජාත්‍යන්තර තලයේ සංවර්ධනය වන රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් පැවතීම ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -